## ගිණුම්කරණ ක්‍රියාවලිය




### මූල්‍ය ප්‍රකාශ යුනු,

***මූල්‍ය ප්‍රකාශයක් යනු ආයතනයේ මූල්‍ය තත්වය සහ ගණුදෙනු පිලිබඳ ව්‍යුහාත්මක මූල්‍යමය ඉදිරිපත් කිරීමකි.*** එනම් ආර්ථික ඒකකය / ගිණුම්කරණ ඒකකයක ගිණුම් කලපරිච්චේදයක් තුල සිදු වූ ගණුදෙනු හා සිද්ධීන් නිසා පැන නැගුණු මූල්‍ය ප්‍රතිඵල, මූල්‍ය තත්වයන් හා මුදල් ප්‍රවාහය වෙනස්වීම මනිනු ලබන ගිණුම් / වාර්තා මූල්‍ය ප්‍රකාශ නම් වේ.

### ගිණුම්කරණ වාර්තා



විශේෂිත පරමාර්ථ වාර්තා පොදු පරමාර්ථ වාර්තා

## විශේෂිත පරමාර්ථ වාර්තා

විශේෂිත මූල්‍ය වාර්තා බිහිකරනුයේ භාවිත කරන්නන්ගේ විශේෂිත අවශ්‍යතා පදනම් කොටගෙන වන අතර එවැනි වාර්තා ලබා ගැනීමට ඔවුන්ට අධිකාරිමය බලයක් ඇත. අලෙවි, නිෂ්පාදන, මූල්‍ය, මානව සම්පත්, පර්යේෂණ හා සංවර්ධන, තොරතුරු පද්ධති සහ සාමාන්‍ය කළමනාකරුවන් වැනි අභ්‍යන්තර කළමනාකරුවන් මෙන්ම බැංකු, අදායම් දෙපාර්තුමේන්තුව වැනි ආයතනයන්ටද විශේෂිත පරමාර්ථ මූල්‍ය වාර්තා ලබා ගැනීමේ අධිකාරියක් ඇත.

## පොදු පරමාර්ථ වාර්තා

අභ්‍යන්තර (අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයින්) හා භාහිර සම්පත් සපයන්නන් (ණයහිමියන් සහ ආයෝජකයින්) භාණ්ඩ හා සේවා මිලදී ගන්නන් (ගණුදෙනුකරුවන්) ව්‍යාපාර කටයුතු විමර්ශනය කරන්නන් (වෘත්තීය සමිති, සේවා යෝජකයන්, රාජ්‍ය නියෝජිත ආයතන) වැනි අභ්‍යන්තර හා භාහිර තීරණ ගන්නන් ගිණුම්කරණ තොරතුරු පදනම් කරගෙන විවිධ තීරණ ගනී. මෙවැනි භාවිතා කරන්නන් විසින් පහත ප්‍රශ්න මතු කරනු ඇත.

- මෙම ව්‍යාපාරයේ මුදල් ආයෝජනය කල යුතුද?
- ව්‍යාපාරයට ණය ලෙඩ ලබා දෙන මුදල් ආපසු ගෙවීමට ඇති හැකියාව?
- ව්‍යාපාරයේ ඉපයීම් හැකියාව කුමක් ද?
- මූල්‍යමය වශයෙන් ව්‍යාපාරය ශක්තිමත් ද?

මේ ප්‍රශ්ණ විසඳා ගැනීම සඳහා ගිණුම්කරණ ක්‍රියාවලියෙන් පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා නමැති නිමැවුම බිහිකරන අතර ඒවා පහත උපාංග වලින් සමන්විත වේ.

## මූල්‍ය ප්‍රකාශ වල අංග / මූලිකාංග

1. විස්තීර්ණ අදායම් ප්‍රකාශය (Comprehensive Income Statement)

2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය / ශේෂ පත්‍රය (Statement of Financial Position)

3. ස්කන්ධ / හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය (Statement of Changes in Equity)

4.මුදල් ප්‍රවාහ ප්‍රකාශය (Cash Flow Statement)

5. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් (Accounting Policies & Explanatory Notes)

## තනි පුද්ගල ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ වැදගත්කම

1. ව්‍යාපාරයේ දළ ලාභය එළිදැක්වීමට.
2. ශුද්ධ ලාභය හෝ අලාභය එළි දැක්වීම.
3. ලාභදායීත්වය පිළිබඳ තොරතුරු සැපයීම.
4. වියදම් පාලනයට රුකුලක් වීම.
5. මූල්‍ය තත්වය පිළිබඳ තොරතුරු සැපයීම.

## අදායම් ප්‍රකාශය

### වෙළඳ හා ලාභාලාභ ගිණුම

යම්කිසි ගිණුම් කලපරිච්ඡේදයක් තුළදී ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රතිඵල එනම් ශුද්ධ ලාභය හෝ අලාභය ගණනය කරන ප්‍රකාශය නැතහොත් අවසාන ගිණුම වෙළඳ හා ලාභාලාභ ගිණුම වේ.

### වෙළඳ ගිණුම

යම්කිසි ව්‍යාපාර ඒකකයක විකුණුම් හා විකුණුම් පිරිවැය සංසන්දනය කරමින් එහි ප්‍රතිඵලය වන දළ ලාභය හෝ අලාභය සොයාගැනීම සඳහා / ගණනය කිරීම සඳහා පිළියෙල කරන ගිණුම / ප්‍රකාශය මේ නමින් හැඳින් වේ.

දළ ලාභය = ශුද්ධ විකුණුම් - විකුණුම් පිරිවැය

ශුද්ධ විකුණුම් = විකුණුම් - ආපසු එවුම්

<u>විකුණුම් පිරිවැය</u>

යම් ගිණුම් කලපරිච්ඡේදයක් තුල භාණ්ඩයන්ගේ පිරිවැය, විකුණුම් පිරිවැය ලෙස හැඳින්වේ.

විකුණුම් පිරිවැය = මුල් නිම් තොගය + ගැනුම් පිරිවැය -

අවසාන නිමි තොගය

ගැනුම් පිරිවැය = ගැනුම් + තීරු ගාස්තු + ගුදම් ගාස්තු + ගෙන එම කුලී + සෘජු වේතන - ආපසු යැවුම්

1. ABC ව්‍යාපාරයේ 2016.03.31 දිනට ශේෂ පිරික්සුමෙන් උපුටා ගත තොරතුරු පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් | 850,000 | ගෙන ඒමේ කුලී | 6,000 |
| ආපසු එවුම් | 6,500 | තීරු ගාස්තු | 4,000 |
| මුල් තොගය (නිමි තොගය) | 15,000 | ගුදම් ගාස්තු | 2,000 |
| ගැනුම් | 350,000 | ආපසු යැවුම් | 4,500 |

2016.03.31 ඉතිරි නිමි තොගයේ වටිනාකම රු. 15,000 කි.

මෙමගින් එම ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙළ කරන්න.

2. X වෙළඳ ව්‍යාපාරයේ ලෙජරයෙන් 2016.12.31 දිනට පහත දැක්වෙන ශේෂයන් උපුටා ගෙන ඇත.

| | රු. | | රු. |
|---|---|---|---|
| මුල් තොගය (නිමි තොගය) | 6,000 | ආපසු යැවුම් | 120 |
| ගැනුම් | 15,000 | තීරු ගාස්තු | 400 |
| ආපසු එවුම් | 1,500 | විකුණුම් | 23,500 |
| ගෙන ඒමේ කුලී | 200 | ගුදම් ගාස්තු | 100 |

බඩු තොගය : නිමි තොගය 2016.12.31 දිනට රු. 5,000 කි.
මෙමගින් එම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙළ කරන්න.

3. XY සමාගමේ ගිණුම් පොත් වලින් 2016.03.31 දිනට පහත සඳහන් ශේෂයන් කිහිපය උපුටාගෙන ඇත.

රු.

| | |
|---|---|
| අත්පිට විකුණුම් | 75,000 |
| ණයට විකුණුම් | 95,000 |
| 2015.04.01 තොගය | 4,000 |
| ආපසු එවුම් | 6,000 |
| ණයට ගැනුම් | 18,500 |
| අත්පිට ගැනුම් | 37,500 |
| ගෙන ඒමේ කුලී | 500 |
| 2016.03.31 දිනට බඩු තොගයේ වටිනාකම | 12,500 |

මෙමගින් එම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ ගිණුම පිළියෙළ කරන්න.

**වෙළඳ ගිණුමක දල ආකෘතිය - සිරස් ආකෘතිය**

............................................ව්‍යාපාරයේ
................................................දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ ගිණුම

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | X X X | |
| ආපසු එවුම් | <u>( X X )</u> | X X X |
| | | |
| <u>විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොගය | X X X | |
| ගැනුම් | X X X | |
| ගෙන ඒමේ කුලී | X X X | |
| තීරු බදු හා ආයාත බදු | <u>X X X</u> | |
| | X X X | |
| (-)ආපසු යැවුම් | ( X X X ) | |
| හානි වූ තොග | ( X X X ) | |
| භාණ්ඩ පරිත්‍යාග | <u>( X X X )</u> | |
| | X X X | |
| (-)අවසන් තොග | <u>( X X )</u> | ( X X X ) |
| දල ලාභය | | <u>XX X</u> |
| | | |

**ලාභාලාභ ගිණුම**

යම්කිසි ගිනුමකරණ ඒකකයක ගිණුම්කරණ කලපරිච්චේදයක් සඳහා උපයන ලද දල ලාභය, ශුද්ධ අලාභය / ලාභය බවට පත්කිරීම සඳහා සකස් කරනු ලබන ගිණුම හෙවත් මූල්‍ය ප්‍රකාශනය මේ නමින් හැදින්වේ.

ශුද්ධ ලාභය = දල ලාභය + අනෙකුත් අයභාර අදායම් - අනෙකුත් අයභාර වියදම්

අනෙකුත් වියදම් වෙනත් = විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් + ආයතන හා පරිපාලන වියදම් + මූල්‍ය හා වෙනත් වියදම්

## විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

ව්‍යාපාරයේ විකුණුම් ප්‍රවර්ධනය ඇතිකිරීමටත්, විකුණුම් ධාරිතාව වැඩි කරගැනීමටත් හා බෙදාහැරීමේ කටයුතු වෙනුවෙන් දරනු ලබන වියදම් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් වේ.

උදා : ප්‍රචාරණ ගාස්තු, ඇසුරුම් ගාස්තු, විකුණුම් වියදම්, ගමන් වියදම්, විකුණුම් සේවක කොමිස්, මෝටර් රථ ක්ෂය, මෝටර් රථ අලුත්වැඩියා වියදම්.

## ආයතන හා පරිපාලන වියදම්

ව්‍යාපරය මනාව පාලනය කිරීම වෙනුවෙන් දරණ ලබන වියදම් පරිපාලනමය වියදම් ලෙස හැදින්වේ.

උදා : රක්ෂණ ගාස්තු, සේවක අර්ථසාධක අරමුදල් වියදම්, වරිපනම් ගාස්තු, වැටුප් හා වේතන, විදුලි ගාස්තු, ආයතනික කුලී, තැපැල් ගාස්තු, සේවක භාරකාර අරමුදල් වියදම්, ගොඩනැගිලි ක්ෂය, යන්ත්‍ර ක්ෂය.

## මූල්‍ය හා වෙනත් වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට අවශ්‍ය මූල්‍ය සම්පාදනය සිදුකිරීමේදී දැරීමට සිදුවන වියදම් සහ වෙළඳ හා ලාභාලාභ ගිණුමේ මෙතෙක් කිසිදු වර්ගීකරණයකට ලක් නොවූ අයභාර වියදම් මූල්‍ය හා වෙනත් වියදම් වේ.

උදා : බැංකු ණය, අයිරා පොලී, බැංකු ගාස්තු, ගිනි හානි අලාභ, මුදල් වංචා, සොරසතුරු අලාභ, ජංගම නොවන වත්කම් විකිණීමේ අලාභ, ආයෝජන

විකිණීමේ අලාභ.

❖ ගනිදු ව්‍යාපාරයේ 2015.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---:|---|---:|
| දළ ලාභය | 856,000 | කාර්යාල උපකරණ ක්ෂය | 900 |
| **අනෙකුත් අදායම්** | | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 200 |
| ලද විකුණුම් කොමිස් | 560 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 150 |
| ලද වට්ටම් | 250 | **බෙදාහැරීමේ වියදම්** | |
| ලැබූ ණය පොලී | 250 | විකුණුම් සේවක කොමිස් | 600 |
| ලැබූ කොමිස් | 700 | ප්‍රචාරණ වියදම් | 5,900 |
| **පරිපාලන වියදම්** | | දුන් වට්ටම් | 610 |
| වැටුප් හා වේතන | 14,500 | ගෙනයාමේ වියදම් | 2,500 |
| ගෙවල් කුලී හා වරිපනම් | 12,500 | මෝටර් රථ අලුත්වැඩියා වියදම් | 6,300 |
| රක්ෂණ වියදම් | 6,300 | **මූල්‍ය වියදම්** | |
| විදුලිය හා දුරකථන | 2,500 | ණය පොලී | 500 |
| නීති ගාස්තු | 500 | මුදල් වංචා | 800 |
| විගණන ගාස්තු | 900 | බැංකු ගාස්තු | 400 |

ඉහත තොරතුරු උපයෝගී කරගනිමින් 2015.03.31 දිනට ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

❖ දවින් ව්‍යාපාරයේ 2016.12.31 දිනට ව්‍යාපාරයේ පැවති මූල්‍ය තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---:|---|---:|
| දළ ලාභය | 45,000 | මුදල් වංචා | 600 |
| ලද වට්ටම් | 500 | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 900 |
| ලැබූ ණය පොලී | 600 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 750 |
| රක්ෂණ වියදම් | 3,500 | වැටුප් හා වේතන | 640 |
| විදුලිය හා දුරකථන | 1,400 | ගෙවල් කුලී හා වරිපනම් | 1,260 |
| දුන් වට්ටම් | 600 | කාර්යාල උපකරණ ක්ෂය | 4,500 |
| ගෙනයාමේ වියදම් | 300 | විගණන ගාස්තු | 700 |
| ණය පොලී | 800 | තොග හානි | 900 |
| මෝටර් රථ ක්ෂය | 6,500 | | |

මෙම තොරතුරු උපයෝගී කරගනිමින් මෙම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් සඳහා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

❖ අෂිනිගේ ව්‍යාපාරයේ 2016.03.31 දිනට ව්‍යාපාරයේ පැවති මුල්‍ය තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| දල අලාභය | 5600 | ලැබූ ණය පොලී | 500 |
| ලද වට්ටම් | 800 | රක්ෂණ වියදම් | 800 |
| මුදල් වංචා | 500 | විදුලිය හා දුරකථන | 8,900 |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 6,300 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 650 |
| දුන් වට්ටම් | 100 | වැටුප් හා වේතන | 9,800 |
| ගෙනයාමේ වියදම් | 500 | ගෙවල් කුලී හා වරිපනම් | 6,300 |
| ණය පොලී | 980 | වරිපනම් | 560 |
| මෝටර් රථ ක්ෂය | 5,600 | විවිධ වියදම් | 890 |
| කාර්යාල උපකරණ ක්ෂය | 3,650 | සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 560 |
| විගණන ගාස්තු | 250 | සේවක භාරකාර අරමුදල් වියදම් | 360 |
| තොග හානි | 120 | ගැනුම් | 25,600 |

මෙම තොරතුරු උපයෝගී කරගනිමින් මෙම ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් සඳහා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

**ලාභාලාභ ගිනුමක දල ආකෘතිය - සිරස් ආකෘතිය**

........................................... ව්‍යාපාරයේ

...................................................................... දිනෙන් අවසන් සඳහා ලාභාලාභ ගිණුම

| | | |
|---|---|---|
| දල ලාභය | | XXX |
| **<u>වෙනත් අදායම්</u>** | | |
| ලද වට්ටම් | XX | |
| ලැබූ පොලී | XX | |
| ලැබූ කොමිස් | | XX |
| දේපළ විකුණුම් ලාභ | | XX XX |
| | | XXX |

**<u>බෙදාහැරීමේ වියදම්</u>**

| | | |
|---|---|---|
| විකුණුම් කොමිස් | X X | |
| ප්‍රචාරණ | X X | |
| බෝල් ණය | X X | |
| අඩමාන ණය | X X | |
| රථ ක්ෂය | X X | |
| බෙදාහැරීමේ වියදම් | X X | ( X X X ) |

**<u>පරිපාලන වියදම්</u>**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | X X | |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | X X | |
| සේවක භාරකාර අරමුදල් වියදම් | X X | |
| විදුලිය | X X | |
| දුරකථන | X X | |
| රක්ෂණ | X X | |
| වරිපනම් | X X | |
| තැපැල් | X X | |
| සේවක ප්‍රසාද දීමනා | X X | |
| ගොඩනැගිලි කුලී | X X | |
| ගොඩනැගිලි ක්ෂය | X X | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | X X | ( X X X ) |

**<u>මූල්‍ය හා වෙනත් වියදම්</u>**

| | | | |
|---|---|---|---|
| තොග කපා හැරීම | X X | | |
| දේපල විකුණුම් අලාභ | X X | | |
| තොග හානි අලාභ | X X | | |
| බැංකු ණය පොලි | X X | | |
| බැංකු ගාස්තු | X X | ( X X X ) | |
| වර්ෂයේ ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කලා X | | | X X |

- ඉෂිනි සමාගමේ ගිණුම් පොත් වලින් 2016.03.31 දිනට පහත සඳහන් ශේෂයන් කිහිපයක් උපුටා ගෙන ඇත.

| | රු. | | රු. |
|---|---|---|---|
| විකුණුම් | 850,000 | ගෙන ඒමේ කුලී | 6,000 |
| ආපසු එවුම් | 6,500 | තීරු ගාස්තු | 4,000 |

| | | | |
|---|---|---|---|
| මුල් තොගය (නිමි තොගය) | 15,000 | ගුදම් ගාස්තු | 2,000 |
| ගැනුම් | 350,000 | ආපසු යැවුම් | 4,500 |
| ලද විකුණුම් කොමිස් | 560 | කාර්යාල උපකරණ ක්ෂය | 900 |
| ලද වට්ටම් | 200 | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 200 |
| ලැබූ ණය පොලී | 250 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 150 |
| ලැබූ කොමිස් | 800 | ණය පොලී | 500 |
| බැංකු ගාස්තු | 400 | විකුණුම් සේවක කොමිස් | 600 |
| වැටුප් හා වේතන | 14,500 | ප්‍රචාරණ වියදම් | 5,920 |
| ගෙවල් කුලී හා වරිපනම් | 12,500 | දුන් වට්ටම් | 680 |
| රක්ෂණ | 6,300 | ගෙනයාමේ වියදම් | 2,500 |
| විදුලිය හා දුරකථන | 2,500 | මෝටර් රථ අලුත්වැඩියා වියදම් | 6,300 |
| නීති ගාස්තු | 500 | මුදල් වංචා | 800 |
| විගණන ගාස්තු | 900 | | |

මෙමගින් එම ව්‍යාපාරයේ 2016.03.31 31 දිනෙන් අවසන් සඳහා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

- ❖ වීරසේකර වෙළඳ ව්‍යාපාරයේ ලෙජරයෙන් 2016.12.31 දිනට පහත දැක්වෙන ශේෂයන් උපුටා ගෙන ඇත.

| | රු. | | රු. |
|---|---|---|---|
| මුල් තොගය (නිමි තොගය) | 6000 | ආපසු යැවුම් | 100 |
| ගැනුම් | 15,000 | තීරු ගාස්තු | 400 |
| ආපසු එවුම් | 1,500 | විකුණුම් | 23,500 |
| ගෙන ඒමේ කුලී | 300 | සේවක භාරකාර අරමුදල් වියදම් | 300 |
| තොග හානි | 100 | ලැබූ ණය පොලී | 560 |
| ලද වට්ටම් | 800 | රක්ෂණ | 870 |
| ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 6,300 | විදුලිය හා දුරකථන | 8,900 |
| දුන් වට්ටම් | 200 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 650 |
| ගෙනයාමේ වියදම් | 500 | වැටුප් හා වේතන | 9,870 |
| ණය පොලී | 900 | ගෙවල් කුලී හා වරිපනම් | 6,300 |

| | | | |
|---|---|---|---|
| මෝටර් රථ ක්ෂය | 5,600 | වරිපනම් | 560 |
| කාර්යාල උපකරණ ක්ෂය | 3,600 | විවිධ වියදම් | 800 |
| විගණන ගාස්තු | 250 | සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 560 |
| මුදල් වංචා | 500 | | |

2016.12.31 දිනට බඩු තොගයේ වටිනාකම රු. 500 කි.
මෙමගින් එම ව්‍යාපාරයේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

❖ සුරුපිනි ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු මගින් වෙළඳ හා ලාභාලාභ ගිණුම පිළියෙල කරන්න.

| | රු. | | රු. |
|---|---|---|---|
| අත්පිට විකුණුම් | 125,000 | ලද වට්ටම් | 5,600 |
| ණයට විකුණුම් | 1254,000 | මුදල් වංචා | 6,300 |
| 2015.04.01 තොගය | 651,000 | ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් | 3,900 |
| ආපසු එවුම් | 6,300 | දුන් වට්ටම් | 9,800 |
| අත්පිට ගැනුම් | 1990,000 | ගෙනයාමේ වියදම් | 5,000 |
| ණයට ගැනුම් | 254,000 | ණය පොලී | 55,000 |
| ගෙන ඒමේ කුලී | 2,600 | ලී බඩු අලුත්වැඩියා වියදම් | 44,000 |
| මෝටර් රථ ක්ෂය | 6,300 | වැටුප් හා වේතන | 88,000 |
| කාර්යාල උපකරණ ක්ෂය | 4,500 | ගෙවල් කුලී හා වරිපනම් | 69,000 |
| විගණන ගාස්තු | 18,000 | වරිපනම් | 556,000 |
| තොග හානි | 5,000 | විවිධ වියදම් | 49,000 |
| ලැබූ ණය පොලී | 56,000 | සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 5,800 |
| රක්ෂණ | 35,000 | දුරකථන ගාස්තු | 8,700 |
| විදුලිය | 269,000 | ගුදම් ගාස්තු | 300 |
| සේවක අර්ථසාධක අරමුදල් වියදම් | 36,000 | ආපසු යැවුම් | 6,500 |

2016.03.31 දින නිමි තොගයේ වටිනාකම රු.5600 කි.

## <u>**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය / ශේෂ පත්‍රය**</u>

ව්‍යාපාර ඒකකයක යම් කිසි දිනකට ව්‍යාපාරයේ **මූල්‍ය තත්ත්වය** පෙන්නුම් කිරීම සඳහා සකස් කරන ලද ප්‍රකාශය මෙයින් අදහස් වේ. එනම් යම් කිසි දිනකට

ව්‍යාපාරය සතු සම්පත් හා එහි හිමිකාරිත්වය පෙන්නුම් කරන ප්‍රකාශනය මෙයින් අදහස් වේ.
එමෙන්ම ශේෂ පත්‍රය තුලින් මූලික ගිණුම්කරණ සමීකරණය නිරූපණය කෙරේ.

**හිමිකම + වගකීම් = වත්කම්**

❖ පැතුම් ව්‍යාපාරයේ 2016.03.31 දිනට පැවැති වත්කම් / වගකීම් / හිමිකම් පහතින් දැක්වේ. එම තොරතුරු ඇසුරෙන් 2016.03.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න

| | රු. |
|---|---:|
| ප්‍රාග්ධන ගිණුම 01.04.2015 | 950,000 |
| 2016.03.31 දිනට ශුද්ධ ලාභය | 65,000 |
| ගැනිලි | 500 |
| බැංකු ණය | 754,000 |
| උකස් ණය | 12,500 |
| උපචිත වියදම් | 350 |
| ණයහිමියෝ | 12,580 |
| බැංකු අයිරාව | 3,650 |
| ඉඩම් හා ගොඩනැගිලි | 658,000 |
| යන්ත්‍රෝපකරණ | 253,600 |
| මෝටර් රථ | 125,400 |
| ලී බඩු හා සවිකිරීම් | 96,220 |
| කීර්තිනාමය | 45,000 |
| ආයෝජනය | 12,000 |
| ස්වාධිකාරය | 3,600 |
| වෙළඳ ලකුණ | 1,250 |
| අවසන් බඩු තොගය | 3,650 |
| ණය ගැතියෝ | 23,000 |
| කලින් ගෙවූ වියදම් | 12,500 |
| ලැබිය යුතු අදායම් | 14,000 |
| මුදල් ශේෂය | 589,860 |

❖ සුපිරි වෙළඳ ව්‍යාපාරයේ ලෙජරයෙන් 2013.03.31 දිනට පහත දැක්වෙන ශේෂයන් උපුටාගෙන ඇත.

| | රු. |
|---|---:|
| ඉඩම් හා ගොඩනැගිලි | 215,000 |

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 12,500 |
| ලී බඩු හා සවිකිරීම් | 32,500 |
| ආයෝජනය | 25,000 |
| අවසන් බඩු තොගය | 1,250 |
| ණය ගැතියෝ | 4,500 |
| ඉතිරිකිරීමේ බැංකු ශේෂය | 2,100 |
| බැංකු ජංගම ගිණුමේ ශේෂය | 12,540 |
| අත ඉතිරි මුදල් | 2,500 |
| ණයහිමියෝ | 56,000 |
| ණය - ලංකා බැංකුව | 126,300 |
| උපචිත වියදම් | 2,580 |
| බැංකු අයිරාව | 12,540 |
| ප්‍රාග්ධන ශේෂය | 32,500 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 78,220 |
| වර්ෂයේ ගැනිලි | 250 |

මෙමගින් එම ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

**ශේෂ පත්‍රයේ දල ආකෘතිය - සිරස් ආකෘතිය**

..........................................ව්‍යාපරයේ

.................................................................දිනට ශේෂ පත්‍රය

| | රු. | රු. | රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපල පිරියත හා උපකරණ** | **පිරිවැය** | **සමු. ක්ෂය** | **ශු.අගය** |
| ඉඩම් | XXX | XXX | XXX |
| ගොඩනැගිලි | XXX | XXX | XXX |
| මෝටර් රථ | XXX | XXX | XXX |
| යන්ත්‍ර උපකරණ | XXX | XXX | XXX |
| ලී බඩු | XXX | XXX | XXX |
| | XXX | XXX | XXX |
| **අස්පෘශ්‍ය වත්කම්** | | XXX | |
| කීර්තිනාමය | | XXX | |
| ස්වාධිකාරය | | XXX | XXX |
| වෙළඳ ලකුණ | | | |
| **ආයෝජන** | | XXX | XXX |
| ස්ථාවර තැන්පතු | | XXX | |
| **ජංගම වත්කම්** | XXX | | |

| | | | |
|---|---|---|---|
| තොග | (XXX) | | |
| වෙළඳ ණය ගැතියෝ / ලැබිය යුතු ගිණුම් | | XXX | |
| | | XXX | |
| අඩමාන ණය වෙන්කිරීම | | XXX | |
| ලැබිය යුතු අදායම් | | XXX | |
| කෙටිකාලීන ආයෝජන | | XXX | |
| ඉදිරියට ගෙවූ වියදම් | | XXX | XXX |
| බැංකු | | | XXX |
| මුදල් | | | |
| **මුළු වත්කම්** | | | |
| | | | XXX |
| | | XXX | |
| | | (XXX) | |
| **ස්කන්ධය හා බැරකම්** | | | XXX |
| මුල ප්‍රාග්ධනය | | | |
| ශුද්ධ ලාභය | | XXX | |
| (-) ගැනිලි | | XXX | |
| අග ප්‍රාග්ධනය | | | XXX |
| **ජංගම නොවන බැරකම්** | | | |
| උකස් ණය | | XXX | |
| දිගුකාලීන ණය | | XXX | |
| | | XXX | XXX |
| **ජංගම බැරකම්** | | | XXX |
| වෙළඳ ණය හිමියෝ | | | |
| ගෙවිය යුතු වියදම් | | | |
| බැංකු අයිරා | | | |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | | | |

❖ උවිදු කේවල ස්වාමි ව්‍යාපාරයේ 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු මගින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන්න.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | 135,500 |
| විකුණුම් | | 178,150 |
| ණය හිමියෝ | | 38,000 |
| ගැනුම් | 56,000 | |
| විවිධ අදායම් | | 3,300 |
| බැංකු ණය | | 20,000 |
| ලැබූ කඩකුලි | | 3,400 |

| | | |
|---|---|---|
| සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි (පිරිවැයට) | 245,000 | |
| යන්ත්‍රෝපකරණ (පිරිවැයට) | 125,000 | |
| මෝටර් වාහන (පිරිවැයට) | 175,000 | |
| ලද වට්ටම් | | 3,200 |
| ප්‍රචාරණය | 9,800 | |
| ආපසු එවුම් | 800 | |
| ආපසු යැවුම් | | 1,600 |
| ගෙන ඒමේ කුලී | 4,300 | |
| ගෙන යාමේ කුලී | 2,500 | |
| ණය ගැතියෝ | 7,800 | |
| විදුලිය | 2,000 | |
| රක්ෂණ | 8,800 | |
| බොල් ණය | 700 | |
| කාර්යාල වියදම් | 9,150 | |
| වේතන හා වැටුප් | 16,800 | |
| විකුණුම් වියදම් | 3,100 | |
| වරිපනම් | 3,800 | |
| බැංකු ශේෂය | | 308,200 |
| මුදල් ශේෂය | 10,000 | |
| බඩු තොගය 2015.04.01 | 10,800 | |
| | 691,350 | 691,350 |

2013.03.31 දිනට බඩු තොගය රු. 28,000 කට තක්සේරු කර ඇත.

❖ රොෂාන් ව්‍යාපාරයේ පොත්වලින් 2016.12.31 දිනට උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැයට | 150,000 | |
| ගෘහ භාණ්ඩ - පිරිවැයට | 80,000 | |
| යන්ත්‍රෝපකරණ - පිරිවැයට | 120,000 | |
| මෝටර් රථ - පිරිවැයට | 100,000 | |
| 2016.12.31 දිනට ක්ෂය වෙන්කිරීම | | |
| ඉඩම් හා ගොඩනැගිලි | | 20,000 |
| ගෘහ භාණ්ඩ | | 10,000 |
| යන්ත්‍රෝපකරණ | | 60,000 |
| මෝටර් රථ | | 25,000 |
| ණය ගැතියෝ | | |
| රොෂාන් පෙරේරා | 18,000 | |
| විමල් ගජදීර | 5,000 | |

| | | |
|---|---|---|
| සේනක මෝටර්ස් | 7,000 | |
| ණය හිමියෝ | | |
| ප්‍රසන්න ට්‍රේඩර්ස් | | 15,000 |
| චන්දිමාල් ස්ටෝර්ස් | | 10,000 |
| දුන් වට්ටම් | 2,000 | |
| ලද වට්ටම් | | 3,000 |
| බෝල් ණය | 1,500 | |
| ප්‍රවාහන වියදම් | 2,800 | |
| විදුලිය | 1,400 | |
| මෝටර් රථ අලුත්වැඩියා | 3,000 | |
| වරිපනම් | 2,200 | |
| රක්ෂණය | 1,800 | |
| කාර්යාල වියදම් | 4,200 | |
| වේතන හා වැටුප් | 15,300 | |
| විකුණුම් | | 250,000 |
| ගැනුම් | 72,000 | |
| ආපසු එවුම් | 1,400 | |
| ආපසු යැවුම් | | 2,800 |
| ගෙන ඒමේ කුලී | 4,200 | |
| ණය පොලී | 8,200 | |
| ප්‍රචාරණය | 4,900 | |
| 15% ණය | | 85,000 |
| ලැබිය යුතු බිල් | 2,000 | |
| ගෙවිය යුතු බිල් | | 4,200 |
| 216.01.01 දිනට බඩු තොගය | 12,500 | |
| බැංකු අයිරාව | | 28,000 |
| මුදල් ශේෂය | 6,300 | |
| ලැබූ කොමිස් | | 700 |
| ප්‍රාග්ධනය | | 112,000 |
| | 625,700 | 625,700 |

2016.12.31 දිනට බඩුතොගය රු. 28,000 කට තක්සේරු කර ඇත.
ඉහත තොරතුරු උපයෝගී කරගනිමින්

1. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ අදායම් ප්‍රකාශය
2. 2016.12.31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන්න.

❖ මකුළු සමාගමේ ගිණුම් පොත් වලින් 2016.03.31 දිනට පහත සඳහන් ශේෂ කිහිපය උපුටාගෙන ඇත.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| ප්‍රාග්ධනය හා ගැනිලි | 24,000 | 172,500 |
| ගැනුම් / විකුණුම් | 420,000 | 920,000 |
| ඉඩම් හා ගොඩනැගිලි - පිරිවැයට | 200,000 | |
| යන්ත්‍රෝපකරණ - පිරිවැයට | 100,000 | |
| ඉන්ධන හා බලය | 20,000 | |
| වරිපනම් | 15,000 | |
| යන්ත්‍ර නඩත්තු වියදම් | 14,000 | |
| ප්‍රචාරණය | 30,000 | |
| බැංකු ණයෙන් ගෙවූ කොටස | 6,500 | |
| තොගය 2015.04.01 | 2,500 | |
| අයාත බඩු | 41,000 | |
| ණය මුදල | | 50,000 |
| ණය ගැතියෝ / ණය හිමියෝ | 60,000 | 40,000 |
| වේතන | 140,000 | |
| බැංකු ණය | | 100,000 |
| ආයෝජන | 160,000 | |
| ආයෝජන අදායම් | | 42,000 |
| වට්ටම් | 2,000 | 4,000 |
| පරිත්‍යාග | 11,000 | |
| සොරාගත් මුදල් | 6,000 | |
| නැති වූ තොග | 9,000 | |
| ලැබිය යුතු / ගෙවිය යුතු බිල් | 75,000 | 40,000 |
| විදුලිය | 32,500 | |
| | 1368,500 | 1368,500 |

2016.03.31 දිනට බඩුතොගය රු. 15,500 කට තක්සේරු කර ඇත.
ඉහත තොරතුරු උපයෝගී කරගනිමින්

1. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ අදායම් ප්‍රකාශය
2. 2016.03.31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන්න.